38 වන පිටෙන්

මාධ්‍රිමංඨ විඥනං........... ආදී වශයෙන් දක්වා ඇත. මේ අනුව සසර ගමනට හේතුව අනුසෝතගාමී අයුරින් අවිද්‍යාවෙන් සැකසුන විඥනායයි. සසර ගඟේ පහළට ඔරු පැදීමේ ගමනින් නිදහස් වීමට නම් පංච උපදනයෙන් නිදහස් විය යුතුය. වෙහසකින් තොරව සසර ගඟේ පහළට අනුසෝතගාමී ඔරු පැදීම අවිද්‍යව තුල ආස්අවාදය ජනක ප්‍රවේශයකි. එහෙත් විකෘතියකි. විඥන මායාවෙන් මිදුන ආයර්‍ය උතුමන් මෙම ආස්වාදයේ ආදීනවය යාථාර්තය ලෙස තමා තුලින් ඔපනයික දහමක් ලෙස නිස්සරණය සාක්ෂාත් කිරීම නිර්වාණාවබෝධයයි. පුද්ගලයෙක් විසින් දහම නැමැති පහුරට නැගී ප්‍රඥව නැමැති හබල යොදගෙන තෙරුවණ් පිළිබඳ ආකරවතී ශ්‍රද්ධාවෙන යුතුව විර්යය සති සමාධි පංචබල ධර්ම ශක්තිය කර ගනිමින් සසර ගඟේ ඉහලට පටිඝෝතගාමීව ඔරුව පැද යායුතුය. අවිද්‍යාව **ප්‍රථිඩෙගමඩ** වූ කල පංච උපාදනයෙන් නාම රෑප වශයෙන් ''මම'' නැමැති අදෘෂ්‍ය මාන සංඥව පිළිගැනීම සසරට අනුගතවීමයි.

''මම'' දුක සමඟත් දුක ''මම'' සමඟත් අනවරතයෙන් බැඳී සිටී. නමුත් මොහොතක් පාසා සංඥව විඥන අවසන්වේ. නමුත් මෙම ''මම'' නමැති, අසරණයා ආයතන (6) හය සමඟ බැඳී ඇති පංච උපාදානයෙන්, අනුසෝතගාමීව සසර ගඟේ පහළට ''මම'' නැමැති කල්පිතය සැප සොයමින් සංසාර සාගරයට කාම, භව, දිට්ඨි හා අවිජ්ජා, ඕඝ, සැඩ පහරට හසුවෙයි. ප්‍රඥව නැමති හබල උපයෝගී කර නොගැනීමේ ප්‍රථිඵලය යළි යළි සසරට බැදෙමින් දුකට උරුම කර ගැනීමයි.

ගත හා සිත නාමරූප ධර්මවල යථාර්තය නම් සිත මොහොතක් පාසා චිත්තකර්ම වලට බිඳේ. ගත ද එසේම රෑප කලාප වලට බිදියයි. මෙම ධර්‍මතා කිසිවක් ප්‍රඥවට හසුනොවීම සත්වයා සසරට බැදීමට හේතුවයි. සැබැවින්ම බාහිරය හදගත් චිත්ත රෑප ජාලයකි. එහි මුලාශ්‍රයට වන ''මම'' සංඥජාලයක් බැව් රොහිතසය සූත්‍රයේ ද දක්වා ඇත.

**"ගමනෙන නපබ්බතතං**
**ලොකසාසසනතං කුදවනං**
**ඉමසම්ං යේව හ්‍යම මංතන කලේබරේ**
**සසෘඤ්ඤමහි සමණාකේ ලෝකංච,**
**ලෝක සමුදයාච ලෝක නිරෝධංච**
**ලෝක නිරෝධ ගාමීණී පටිපදයංච**
**පඤ්ඤංපෙමි"**

මේ අයුරින් බඹයන් පමණ සිරුර තුළ ලෝකයද ලෝක නිරෝධයද පණවා ඇත. මෙසේ පණවා ඇත්තේ ඇස, කන, ආදී ඉඳුරන් මෙන්ම හේතුඵල දහම මත එම ඉඳුරන් ඇසුරේ ජනිත වන වර්ණා ශබ්ද ගඤාදී රෑප සමුදයද හුදෙක් සංඥ ජලයක්ම බැවින. එසේම පූර්ණ නිවන් මගද මේ තුළට පණවා ඇත්තේ සංඥ නිරෝධ සමඟ විඥන නිරෝධයද ඒ සමඟ සම්මුති ලෙස මායාවකට හසුවන තනාගෙන ඇති ලෝක නිරෝධ්‍යයද සිදුවන බැවිනි. මෙම ''මම'' නැමැති ලෝකය ක්ෂාර නිරෝධයට හසුව ඒ සමඟම සිදුවන සමුදය ධර්‍මතාවය දැකීම **"හේතුං පටිච්ච සම්භූතං හේතු භඩගා නිරුජාඩති"** යන විශ්ව යථාර්තය දැකීමයි. එය චතුරාර්‍ය සත්‍ය දැකීමයි. මෙහිදී ආර්ය යෝගවාචරණ විසින් - ඉමාසම්ං සති ඉධං හොති - ඉමසස උපපාද ඉමං නිරුප්ජති චතුරාර්‍ය සත්‍ය ධර්මය පාදක විශ්ව යථාර්තය - එනම් සංඥව ඇති කල්හි විඥනය උපදී, සංඥව නැති කල විරූනය නිරෝධය යන ධර්‍ම නියාය අවබෝධ වීම සිදු කෙරේ.

ආත්මවාදය පදනම් කරගත් බ්‍රාහ්මණ සමාජයේ නිත්‍ය සුඛ ආත්ම වශයෙන් ඉදිරිපත් කල න්‍යාය ප්‍රතික්ෂේප කරමින් උපනිෂද් මුනිවරු අනිත්‍ය දුක්‍ය අනාත්ම න්‍යාය ඉදිරිපත් කළහ. බුදුන් ඉදිරිපත් කල න්‍යායය වන්නේ, ''නිසසතෙනා, නිජණීවා සුඤ්ඤෝ වශයෙන් ලෝකය නැමැති, සම්මතයේ යථාර්ථය ශුන්‍ය බවයි. නමුත් මෙම ශුන්‍යතාව ඕලාරික ඇසට ගෝචර නොවේ. එය විෂය වන්නේ ප්‍රඥ ඇසට පමණි. ''කිරියෝ අත්‍ථි කාරකා නත්‍ථි'' ක්‍රියාවක් ඇත ද කරන්නෙක් නැත මෙම යාථාර්තයේ පිහිටා මනස කරා යොමුවන සියළු සංඥ ඒ කාරණයේම නිරෝධය, බිදි බිඳීයාම තදින් මනසට යොමු කළ යුතුය. එවිට සංඥ නිරෝධබව පංච නීවරණ නිරෝධය. ත්‍රිවිධ තණ්හා නිරෝධය එකවර එකම තැන සිදුවේ. එය එහිපස්සිකො, අකාලික, ඕපනයික, දහමයි.

කාම රෑප අරෑප භව උපත ලද සත්වයින් පංච උපාදනය සහා බැඳී ඇති ප්‍රපංචය තුල ආස්වාදමය මිස එහි ආදීනමය දුක බැව් පසක් නොකරනතාක් පාරමී සම්පූර්ණ නොවේ. ලෝකයේ න්‍යාය සිද්ධාන්ත සැමට ගෝචර නොවේ. ගුරුවත්වාකර්ෂණ න්‍යාය ආනිම්ස්සගේ ප්‍රඥවට ගෝචර විය. එසේම ලෝකය ගෝලාකාර බැව් සොක්‍රටීස්ගේ ප්‍රඥාවට යොමු වූ අතර පර්මාව පිළිබඳ න්‍යාය ආකිම්ඩිස් විසින් සොයා ගැනිනි. මෙමගින් සනාථ වන්නේ ලොව සැඟවුන යථාර්ථයන් සියල්ල සියළු දෙනාට ගෝචර නොවන බවයි. බාහිර සම්මුතියේ යථාර්තය ශුන්‍යතාව බැව් ප්‍රඥවට ගෝචර වනුයේ උපපාරමී සපුරමිනි.
ඉහත කී පාරමී උපපාරමී සපුරාලීමේ දී කල්‍යාණමිත්‍ර සම්පත්තිය උපකාරවේ. එහෙත් පරමාව පාරමී සපුරාගෙන නිර්වාණ ධර්මතාව සාක්ෂාත් කිරීම තමා විසින්ම විර්යය සති සමාධි ප්‍රඥ පංචබල ධර්ම මඟින් කළ යුත්තකි. සම්බුදුහු ''තුම්මෙහි කිචඡං ආතප්පං අක්ඛාකාරො තථාගතා'' එය තොප විසින්ම කළ යුක්තෙකැයි වදලහ. මෙම නිර්වාණ ධර්‍මය සාක්ෂාත් කරන උතුමා සංකල්ප ජාලයම - වර්ණ රෑප ධම්ම, ශබ්ද රෑප ධම්ම, ගන්ධරෑප ධම්ම ආදී ලෙස සියළු ධර්‍ම දනය කෙරේ අත හරී. එයයි ''සබ්බ දනං ධම්ම දනං ජිනාති'' ලෙස පැහැදිලි කළේය. මහා සාංඝික දනයකට වඩා ක්ෂණධක ''මම'' යන මිථ්‍යාවෙන් මිදීම - හෙවත් අතහැරීම උතුම්ම දනයයි.

සිත, කය, වචනය තිදොරින් සිදුවන සංඥ උපදනය වෙනුවට - වාරණ්‍ය කිරීම තුල සීල පාරමිතාව ද සපිරේ. මෙහි දී ඒ ඒ ඉඳුරන් ඇසුරේ වර්ණ සංඥ, ගඤ සංඥ, රාසා පහස ධම්ම ආදී සංඥ වාරණය වන විට කෝටියක් සංඥ වර්ණ සීලයේ පිහිටයි. ඉහත කී වර්ණ ශබ්ද ගඤාදිය පිළබඳ ඇති වන දෘෂ්ටියෙන් මිදීම දිටඨිවෙ අනුපගමම සීලයයි. එම සීලයෙහි පිහිටි ආර්යය උතුමා යළි ''නා හිජාතු ගබ්බ සෙයයං'' යළි ඇස කන දිව ආදි ගැබ් ආශ්‍රය උපත නොලබයි.

පෘථග්ජන පුද්ගලයා
අනවබෝධයෙන් ආස්වාදය මුලා වී පංච උපාදනයෙන් මම නැමැති විඥනයට අනුගත වීම දුක්‍ය සත්‍යයයි. හේතුඵල දහම මත ඒ ඒ ඉඳුරනට ගෝචර සංඥ වශයෙන් සමුදය වන්නේ හුදෙක් මිරිඟුවක් පමණක් සේ අවබෝධය සමුදය සත්‍යයයි. එසේ සමුදව වන මංරෑ ජාලය වන නිරෝධ නක පන ප්‍රඥාවෙන් දැකීම නිරෝධ සත්‍යයි. බුදු පියාණන් අනාවරණය කරගත් සොබාදහම ඇතුළු ලෝක ක්‍රියාත්මක රිද්මය සමුදය හා නිරෝධව එකවර එකම තැන සවයං සිද්දි ස්වභාවය ප්‍රඥවෙන් දකිමින් ශුන්‍යතාවය එකම පරමාර්ථ ධර්මය බැව් දැකීම මාර්ග සත්‍යයි.

**References,**
1 Low thuradhamsevena - Rev. Aswana sooranabuddhapaiya Thero
2 Abisambodi - Rev. Buddhganayana Thero, S.M.R. Kapugedara, Rta, Directory Education, Publication Communication, Ministry Of Education

**සහන් වීරසේකර ලියන බුද්ධක පැටියාගේ අක්ෂරය**
**වෛද්‍ය බෝධිනී සමරතුංග ලියන අනිත් කොණ**
**සිසිර දිසානායක ලියන ගී සඳලුව**
**යන ලිපි නොවැළැක්විය හැකි හේතු මත මෙවර පළ නොවන බව කරුණා වෙන් සළකන්න**

RESIDENTIAL DESIGNS, PERMITS DRAWINGS
RANJ DESIGN & DRAFTING SERVICES
RANJITH WANNINAYAKE
- FREE ADVICES
- PLANS–SINGLE/DOUBLE STOREY/ EXTENSIONS/DECKS/CARPORTS
- PLANNING PERMIT DRAWINGS
- BUILDING PERMIT DRAWINGS
REGISTERED Building Practitioner
bdav
3/19 Balmain Court, Lalor 3075
Tel: 0430 066 241 Email: designrake@gmail.com

සන්නස SANNASA CARTOON By PK

